(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 163.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ජුලි 09 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1543/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට සිට සීපෝත්, නාගස්තැන්න හරහා නාවලපිටිය දක්වා ඇති මාර්ගය වර්ෂ 20ක පමණ කාලයක සිට පිළිසකර නොකිරීමට හේතු කවරේද;

(ii) කොළඹ සිට නාවලපිටිය දක්වා විකල්ප මාර්ගයක් ලෙස ඉහත මාර්ගය භාවිත කළ හැකි බව දන්නේද;

(iii) ඉහත මාර්ගයේ කිලෝ මීටර් 9 සිට සංවර්ධනය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් කර තිබුණේද;

(iv) ඒ සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(v) එම සංවර්ධන කටයුතු නිසි ලෙස සිදු කර තිබේද;

(vi) එහිදී නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර තිබේද;

(vii) ඉහත මාර්ගයේ සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1642/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගන සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උතුරු සහ නැගෙනහිර පළාත්වල ඉදිරියේදී නව ක්‍රිකට් ක්‍රීඩාංගන ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රීඩාංගන ඉදිකිරීමට නියමිත ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයන් සිටින බව දන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ව හඳුනාගෙන ජාතික කණ්ඩායමට ඇතුළත් කර ගැනීම සඳහා තිබෙන වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1740/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004.12.26 දින ඇතිවූ සුනාමි ව්‍යසනය හේතුවෙන් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආපදාවට ලක්වූ ජනතාවට නිවාස අහිමිවූ බවත්;

(ii) එම ජනතාව සඳහා රජය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් පෞද්ගලික ඉඩම්වල සහ රජයේ ඉඩම්වල විකල්ප නිවාස ඉදිකර ලබාදී ඇති බවත්;

(iii) එම විකල්ප නිවාස, සර්වෝදයපුරම්, සෙංකාමම්, හිජ්රා නගර්, කනහර් ගම්මානය, කෝමාරි 1 සහ කෝමාරි 2 යන ග්‍රාම නිලධාරි වසම්වල පිහිටි රජයේ ඉඩම්වල ඉදි කර ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) වසර 18කට අධික කාලයක් ගතවී ඇතත් මේ වනතෙක් එම ජනතාවට අදාළ ඉඩම් ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම ජනතාවට කඩිනමින් ඉඩම් ඔප්පු ලබාදීම සඳහා ගෙන ඇති හෝ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1789/2025

ගරු බී. ආරියවංශ මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වතු ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම වතු ගම්මානවල ජීවත්වන පවුල් සංඛ්‍යාව එක් එක් ගම්මානය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ගම්මානවල යටිතල පහසුකම් ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1888/2026

ගරු අබූබකර් අතම්බාවා මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බොලිවේරියන් ගම්මානයේ පිහිටි EHED සුනාමි නැවත පදිංචි කිරීමේ, ඉස්ලාමාබාද් සහ පෙරියනීලාවනෛයි යන නිවාස යෝජනා ක්‍රම පරිහානියට පත්ව මූලික පහසුකම් අක්‍රිය තත්ත්වයට පත්වීමෙන් පදිංචිකරුවන් දුෂ්කරතාවන්ට මුහුණදී සිටින බවත්;

(ii) නිරන්තර ගංවතුර හේතුවෙන් රැඳෙන ජලය, වැසිකිළි සහ අපජල පද්ධතිය සමඟ මිශ්‍ර වීමෙන් මදුරුවන් බෝ වීම සහ රෝග පැතිර යාම ඇතුළුව සෞඛ්‍ය ගැටලු ඇතිවී ඇති බවත්;

(iii) ඒ හේතුවෙන් වැඩිහිටියන්, කාන්තාවන්, දරුවන් සහ රෝගීන් පීඩාවට පත්වී ඇති බවත්;

(iv) ඉහත නිවාස යෝජනා ක්‍රමවල ක්‍රියාත්මකවූ සහාධිපත්‍ය දේපල කමිටු දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රියව පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාස යෝජනා ක්‍රමවල පවතින සෞඛ්‍ය, කානු පද්ධති සහ ගංවතුර ගැටලු විසඳීමට ගනු ලබන ක්ෂණික පියවර කවරේද;

(ii) මෙම නිවාස යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම හෝ යළි ගොඩනැගීම සඳහා ප්‍රායෝගික සහ ස්ථිර විසඳුමක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා යෝජිත කාල වකවානු කවරේද;

(iv) මේ වනවිට අක්‍රියව පවතින සහාධිපත්‍ය දේපල කමිටු සක්‍රිය කිරීම සඳහා ගත වන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1906/2026

ගරු ආර්.ජී. විජේරත්න මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේමළුව ග්‍රාම නිලධාරි වසමේ පවුල් 43ක් පදිංචිවී සිටින ප්‍රදේශය පුරාවිද්‍යා සංරක්ෂිත කලාපයක් ලෙස ගැසට් කර ඇති බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතයට බාධා සිදුවී ඇති බව පිළිගන්නේද;

(iii) එම ඉඩම් සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ඔප්පු ලබා දීම ප්‍රමාදවී ඇත්තේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව නොමැති වීම හේතුවෙන් බව දන්නේද;

(iv) මෙම කාරණය සම්බන්ධයෙන් යම් සහනදායි පියවරක් ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1940/2026

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) එම ව්‍යාපෘති ආරම්භ කිරීමේදී රජයේ මැදිහත්වීම හා ග්‍රාමීය ප්‍රජා දායකත්වය කවරේද;

(iii) එම ව්‍යාපෘති පවත්වාගෙන යනු ලබන ප්‍රජා ජල කමිටුවල/සමිතිවල ව්‍යුහය සහ වගකීම කවරේද;

(iv) එම ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් පාලන ආයතන ඇතුළුව රජයේ ආයතනයන්ට මැදිහත්වීම සඳහා ක්‍රමවේදයක් තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රජා ජල ව්‍යාපෘති නියාමනය සහ විගණනය කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) මේ දක්වා සිදු කරන ලද විගණනවලින් අනාවරණයවූ කරුණු සම්බන්ධයෙන් පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2025/2026

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නේවාසික වීසා මත ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ගේ සෞඛ්‍යය තත්ත්වය තක්සේරු කිරීම සඳහා 2018/2019 වර්ෂයේදී සංක්‍රමණය සඳහාවූ ජාත්‍යන්තර සංවිධානය විසින් ජාත්‍යන්තර සෞඛ්‍ය තක්සේරු මධ්‍යස්ථානය පිහිටුවන ලද බවත්;

(ii) මූලික ස්ථාපන පිරිවැය අයකර ගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එම මධ්‍යස්ථානය පවරා ගනු ලබන බවට ඇති අවබෝධය මත එය ස්ථාපනය කරන ලද බවත්;

(iii) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් එම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාදවූ බවත්;

(iv) 2025 සහ 2026 වර්ෂවලදී ජාත්‍යන්තර සෞඛ්‍ය තක්සේරු මධ්‍යස්ථානය පවරා ගන්නා බවට සහතිකවීම් ලබා දුන්නද, ඒ සම්බන්ධ කිසිදු ප්‍රගතියක් අත්වී තිබෙන බවක් නොපෙනෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තර සෞඛ්‍ය තක්සේරු මධ්‍යස්ථානය පවරා ගැනීම සඳහා නිශ්චිත සැලැස්මක් සහ කාලරාමුවක් තිබේද;

(ii) එම මධ්‍යස්ථානය හරහා උපයනු ලබන වාර්ෂික ආදායම අයකර ගැනීම අත්හැරීමට අමාත්‍යාංශය අදහස් කරන්නේද;

(iii) එකී ආදායමෙන් අමාත්‍යාංශයට ලැබුණු 15%ක කොටස මේ දක්වා භාවිත කර ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2035/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය සඳහා සේවා ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) එම සේවා ව්‍යවස්ථාව අනුව තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iii) සේවා ව්‍යවස්ථාව අනුව ගුරු උපදේශකවරුන්ගේ කාර්යභාරය කවරේද;

(iv) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේදී ගුරු උපදේශකවරුන්ට විශේෂ කාර්යභාරයක් පවරා තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුරු උපදේශක සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් පළාත සහ විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගුරු උපදේශක සේවයේ පුරප්පාඩු පවතින තත්ත්වයක් තුළ අදාළ රාජකාරි ආවරණය කිරීම සඳහා යොදා ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2052/2026

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ සිට මහනුවර සහ නාවලපිටිය දක්වා මේ වනවිට දුම්රිය ගමනාගමනය සිදු නොවන බව දන්නේද;

(ii) 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් එම දුම්රිය මාර්ගයේ හානිවූ ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම හඳුනාගත් ස්ථාන අතරින් සිදුවී ඇති හානිය ඇස්තමේන්තුගත කර ඇති ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම හානි සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ආපදාවට ලක්වූ සියලු ස්ථාන පිළිසකර කර සංවර්ධනය කිරීමට අපේක්ෂිත කාලසීමාව කවරේද;

(vi) මාස 06ක් ඇතුළත එම දුම්රිය මාර්ගය පිළිසකර කර මහනුවර දක්වා දුම්රිය ගමනාගමනය නැවත ආරම්භ කිරීමට හැකියාව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"1999 අංක 2 දරන ශ්‍රී ලංකා කැල්වරි දේවස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ තීරණය (අංක 1),— “විදේශ ප්‍රේෂණ මත එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට අදාළව 2022 මැයි 01 දින සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය” පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2025.04.02 දින සිදුකරන ලද පරීක්ෂණ සම්බන්ධයෙන් කරුණු ඇතුළත් 2025 ඔක්තෝබර් 24 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 318 දරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4)හි විධිවිධාන ප්‍රකාරව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

*5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ තීරණය (අංක 2),— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අදාළ ආයතන සම්බන්ධයෙන් එකී කාරක සභා රැස්වීම්වල දී සිදු කරන ලද විමර්ශනවලට අදාළව සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවන්හි ඇතුළත් වාර්තා මඟින් හඳුනාගත් මෙහි පහත ඇමුණුමේ සඳහන් සිද්ධි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4)හි විධිවිධාන ප්‍රකාරව නිසි පියවර ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි:—

**ඇමුණුම**

| අනු අංකය | ආයතනය | කාරක සභා රැස්වීම පැවැත්වූ දිනය | වාර්තාව සභාගත කළ දිනය හා පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය | නිශ්චිත සිද්ධිය/සිද්ධි |
|---|---|---|---|---|
| 1. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.05 හා 2025.03.27 | 2025.06.04 PS 212 | 1. කිලෝ ග්‍රෑම් 510ක් බර “Rough Sapphire Cluster” මැණික් පාෂාණය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 2. හෙරණියාවක මැණික් ඉල්ලම ඉවත් කර ගැනීම සඳහා වන ව්‍යාපෘතිය. |
| | | | | 3. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට නව ගොඩනැගිල්ලක් කුලියට ගැනීම. |
| 2. | ශ්‍රී ජයවර්ධනපුර මහරෝග්‍යශාලා මණ්ඩලය | 2025.05.15 | 2025.07.24 PS 242 | 1. විදුලි පද්ධතියේ ආරක්ෂාවට ගෙන් වූ උපකරණ ප්‍රධාන පද්ධතියට සම්බන්ධ කිරීම. |
| | | | | 2. දීමනා ගෙවීම්වල අක්‍රමිකතා සහ බඳවා ගැනීම් පටිපාටිය. |
| | | | | 3. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු සඳහා බඳවා ගැනීම. |
| 3. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.05.08 හා 2025.07.17 | 2025. 12.18 PS 391 | 1. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා අරමුදලෙන් කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා මුදල් වියදම් කිරීම. |
| | | | | 2. එස්. ආර්. රෙන්ගනාදන් මහතාට ඉඩම් ලබාදීම (මාතලේ බේගෲප් වත්ත). |
| | | | | 3. මාලනී නානායක්කාර මහත්මියට ඉඩම් ලබාදීම (ඉඹුල්ගස්වාඩිය, කටාන) |
| | | | | 4. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයන්ට ඉඩම් ලබාදීම. |

| | | | | |
|---|---|---|---|---|
| 4. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 2025.06.04 | 2025.12.18 PS 392 | 1. විශ්වවිද්‍යාලයේ නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම.<br>2. විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා නිවාස සංකීර්ණයක් ඉදි කිරීමේදී සිදුවූ අක්‍රමිකතා.<br>3. 2021 වර්ෂය තුළ තාක්ෂණ පීඨය සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීම.<br>4. විශ්වවිද්‍යාල භූමියෙන් අනවසරයෙන් පස් කැපීම.<br>5. උපකුලපතිවරයාට අයිතිව තිබූ නිවසක් බදු පදනම මත ශිෂ්‍ය නේවාසිකාගාරයක් සඳහා ලබාදීම. |
| 5. | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය | 2025.08.20 | 2025.12.18 PS 394 | 1. වීරවිල සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම. |
| 6. | ලංකා සතොස ලිමිටඩ් | 2025.10.10 | 2025.12.18 PS 397 | 1. සේවක දිරි දීමනා ගෙවීම.<br>2. කිලිනොච්චිය නගරයේ පිහිටි සමාගම සතු වර්ග අඩි 15000ක ගොඩනැගිල්ල බදු පදනමට ලබාදීම.<br>3. කාර්ය සාධන දීමනා හා වෘත්තීය දීමනා.<br>4. ප්‍රවාහන දීමනා. |
| 7. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.02.27 හා 2025.05.23 | 2026.01.08 PS 435 | 1. නේවාසික පුහුණුවක් ලබාදීමකින් තොරව ගෘහ සේවිකාවන් විදේශගත කිරීම නිසා කාර්යාංශයට අලාභයක් සිදුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 2. විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරීන් පත් කිරීම |
| | | | | 3. "Glocal Fair" (ජයගමු ශ්‍රී ලංකා) වැඩසටහන. |
| | | | | 4. "Glocal Fair" (ජයගමු ශ්‍රී ලංකා) වැඩසටහන වෙනුවෙන් වෙළඳ කුටි ලබා ගැනීම. |
| | | | | 5. "විගමණික හරසර" වැඩසටහන පැවැත්වීම. |
| 8. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.19 හා 2025.11.26 | 2026.02.19 PS 476 | 1. බිම්පුත් ෆිනෑන්ස් සමාගමට (Bimputh Finance PLC) ණය ලබා දීම. |
| | | | | 2. පුද්ගලයන් දෙදෙනෙකු වෙත 2020 දෙසැම්බර් 23 දින ලබා දී ඇති රු. මිලියන 164.73 ක් වූ බද්ධ දේපළ ණය. |
| | | | | 3. ණය තොරතුරු කාර්යාංශ වාර්තාවේ සඳහන් ණය පහසුකම් 10ක අක්‍රමවත් ආපසු ගෙවීම් සලකා බැලීමකින් තොරව ණය ගැණුම්කරුවෙකුට රු. මිලියන 12.6ක ණයක් ලබා දීම. |
| | | | | 4. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් RPI Private Limited නැමැති මාලදිවයින් සමාගමක් වෙත ලබාදී ඇති එක්සත් ජනපද ඩොලර් මිලියන 9ක් වටිනා සම්මේලනික ණය. (Syndicate Loan) |

*6.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*9.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

12.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

13.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

කෝද්දාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

2117/2026

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ජය ඉසුර' වැඩසටහන ආරම්භයේ සිට එය යටතේ අනුමත කර ඇති ණය ප්‍රමාණය සහ එම ණයවල මුළු වටිනාකම කොපමණද;

(ii) 4% - 5% දක්වාවූ සහනදායී පොලී සහනාධාරය ගෙවා තිබේද;

(iii) එසේ නම්, එම වැඩසහනේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ එම වැඩසටහන මඟින් ලබාගත් ප්‍රතිලාභ කවරේද;

(iv) එම වැඩසටහනට සහභාගි වන වාණිජ බැංකු, එම වැඩසටහනට අනුකූලව කටයුතු කර, අමාත්‍යාංශයෙන් අදාළ පොලී වෙනස ලබාගෙන තිබේද;

(v) වෙනත් වාණිජ බැංකු හරහා ණය ගෙවූ ණය ගැනුම්කරුවන් එම සහනාධාරය සඳහා සුදුසුකම් ලබා තිබුණේද;

(vi) එසේ නම්, ඔවුන්ට එම සහනාධාරය ලබාදී තිබේද;

(vii) වැඩසටහනේ අරමුණු සහ අපේක්ෂිත ප්‍රතිලාභීන් විසින් ලබා ගත් ප්‍රතිලාභ අතර යම් විෂමතාවයක් පිළිබඳව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2019 අප්‍රේල් සහ නොවැම්බර් අතර කාලය තුළ සම්පත් බැංකුව හරහා අනුමැතීන් ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම අනුමැතීන් සංඛ්‍යාව සහ වටිනාකම කොපමණද;

(iii) සීමාසහිත ග්ලෙන්රොක් (පෞද්ගලික) සමාගම විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතේ වර්තමාන තත්ත්වය සහ අනුමත කර තිබේ නම්, අදාළ ප්‍රතිලාභ ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2119/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සීමා නිර්ණය කොමිෂන් සභාව වෙත පවරා ඇති වගකීම් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාලය තුළ එම කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස කටයුතු කළ පුද්ගලයන් කවරේද;

(iii) එම කාලය තුළ කොමිෂන් සභාව විසින් ඉටු කරන ලද කාර්යයන් කවරේද;

(iv) ඉහත කාලය තුළ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ වැටුප්, දීමනා, පහසුකම් සහ කාර්යාල කුලී සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2015 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සේවක වැටුප් සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iv) එම කොමිෂන් සභාව ස්ථිර කොමිෂන් සභාවක් ලෙස පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2120/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 සිට අවුරුදු 67 දක්වා සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ වයස අවුරුදු 63 සිට අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහාවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතක් සකස් කිරීමට කැබිනට් මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදී තිබේද;

(iii) අමාත්‍යවරයා හෝ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එවැනි කෙටුම්පතක් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට උපදෙස් ලබාදී තිබේද;

(iv) උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යාමේ වයස දීර්ඝ කිරීම සාධාරණීකරණය කිරීම සඳහා පදනම්වූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?